# UMT Spotlight

QUARTERLY NEWSLETTER OF UNITY MISSION TRUST

FEBRUARY ISSUE 01/2014 www.unitymission.lk

Inside This Issue


| | |
|---|---|
| Ray of Hope 2 | 01 |
| Power ONE Hundred | 01 |
| Unity Camp 6 | 01 |
| Incoming Trustee | 01 |
| Davidson College | 04 |
| Achievements | 05 |
| UMT Spotlight | 6,7 |
| Rukshan Perera Live in Concert IV | 07 |
| Payment Gateway | 08 |
| Upcoming Events | 08 |
| Contact Us | 08 |


## Our Journey;

- Menik Farm (May-Sept '09)
- Jaffna & Kayts (April '10)
- Kayts (June '10)
- Vidutaltivu & Mannar (Sept '10)

UC 1 - Colombo (Dec '10)

UC 2 - Mullaithivu (Jun '11)

Ray of Hope - Colombo (Oct '11)

UC 3 - Mannar (Dec '11)

UC 4 - Tharanikkulam (Jun '12)

Zoom In 1 – Colombo (Sept '12)

UC 5 - Kandy (Oct '12)

Zoom In 2 - Colombo (Dec '12)

Zoom In 3 - Mullaithivu (April '13)

Zoom In 4 - Kilinochchi (April '13)

Ray of Hope 2 -Colombo (Sept '13)

Power ONE Hundred (Sept '13)

UC 6 - Kilinochchi (Oct '13)

# Unity Mission Trust

## බලාපොරොත්තුවේ අරුණැල්ල 02' සහ 'ජාතික එකමුතුකම සහ සහයෝගීතාවය සඳහා වන සම්මාන උළෙල



'ජාතික එකමුතුකම සහ සහයෝගීතාවය සඳහා වන සම්මානය ලාභීන් UMT නිර්මාතෘ, ප්‍රධාන අමුත්තිය සහ භාරකාර සභාපතිද කැටුව

2013 වසරේ සැප්තැම්බර් 13 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී යුනිටි මිෂන් භාරය විසින් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන් නියෝජනය කරමින් පැමිණි 100 ක් වූ තරුණ නායකයින්ගේ සහභාගීත්වයෙන් කොළඹ දී මෙම වැඩසටහන පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස ජනාධිපති ආර්යා ශිරන්ති වික්‍රමසිංහ රාජපක්‍ෂ මැතිණිය සහභාගි විය. සවස් භාගයේදී තරුණ නායකයින් සිය දෙනාම සාම්ප්‍රදායික ඇඳුමින් සැරසී, සුදු නෙළුමක් අතැතිව පැමිණියේ. මඩ වගුරකින් මතුවිය හැකි සුන්දරත්වය පිළිඹිබු කරමිනි. ඉන්පසු පැය දෙකක කාලයක් පුරාවට අප රටේ වටිනා සංසකෘතිය සහ සැගවුණු දක්‍ෂතා පෙන්නුම් කෙරෙන අංගයන් පැවැත්විණි.

..... 3 වෙනි පිටුවට

## යුනිටි කඳවුර 6

2013 වසරේ ඔක්තෝම්බර් මස මාධ්‍ය සහ ප්‍රචාරණ කාණ්ඩායමේ ප්‍රධානියා ලෙස මා සමඟ, 500 ක් වූ ශිෂ්‍ය නායකයින් සහ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පාසල් නියෝජනය කරමින් පැමිණි 40 ක් වූ ගුරුවරුන් කිලිනොච්චි මධ්‍ය විද්‍යාලයට එක් වූයේ යුනිටි මිෂන් කඳවුර වෙනුවෙනි.

මෙවැනි ව්‍යාපෘති සංවිධානය කරන යුනිටි මිෂන් භාරය වැනි කණ්ඩායමක සාමාජිකයෙකු වීම තවත් එක් අත්දැකීමකි. ශ්‍රී ලංකාවේ ජන කොටස් අතර, විශේෂයෙන් ම තරුණ පරපුර අතර, එකමුතුකම සමගිය සහ සහයෝගිතාවය ගොඩ නැංවීම උදෙසා යුනිටි මිෂන් භාරය වෑයම දරන බව කවුරුත් දන්නා කරුණකි.

...... 4 වැනි පිටුවට.

## 'Power ONE Hundred'' වැඩසටහන

මෙම වැඩසටහන 2013 වසරේ අගෝස්තුමාසයේ දී ආරම්භ කෙරුණු අතර, මෙහිදී විවිධ ප්‍රදේශයන්ගෙන් තෝරාගත් තරුණ නායකයින් 10 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 'Stepping out in to the world' තේමාව රැගත් වැඩසටහනක් පැවැත්විය. මෙහිදී අරාධිත අමුත්තන් සහ සිසුන් අතර විශාල අන්තර් සම්බන්ධතාවයක් ගොඩනැංවන ආකාරයට කටයුතු සැලසුම් කර තිබුණු අතර, එහි මූලික පදනම සලසමින් .

...... 3 වැනි පිටුවට



කණ්ඩායම් සාකච්ඡාවක්

## භාරකාර මණ්ඩලයේ නව සාමාජිකාව



භාරකාර මණ්ඩලයේ නව සාමාජිකාව - නිර්මලී වික්‍රමසිංහ මහත්මිය

අප රටේ තරුණ පරපුර සමඟ කටයුතු කිරීම සම්බන්ධයෙන් නිර්මලී වික්‍රමසිංහ මහත්මිය අමුත්තියක නොවන්නේ ඇය උතුරු ප්‍රදේශයේ මෙන්ම කොළඹ සහ විදෙස් රටවල පවා අධ්‍යාපන ආයතන ගණනාවක කටයුතු කර ඇති හෙයිනි. ඇයගේ වසර 39 ක් වූ අත්දැකීම් සමුදායේ ආරම්භය ඇයට වයස අවුරුදු 22 දී, එනම් විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් වූ වහාම ත්‍රිකුණාමලයේ සිංහල මහා විද්‍යාලයට ඇය ලද පළමු ගුරු පත්වීමත් සමඟයි. ශ්‍රී ලංකාවේ සහ සීෂෙල්ස් ජනපදයේ පාසල් ගණනාවක ඉගැන්වීම් කටයුතු කළ මැය පසුකාලීනව බිශොප් විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිනිය ලෙසත්, ඉන් අනතුරුව කොළඹ කාන්තා විද්‍යාලයේ විදුහල්පතිනිය ලෙසත් කටයුතු කළාය. ඉන් අනතුරුව ඇය යුනිටි මිෂන් භාරයේ නවතම භාරකාරවරයෙකු ලෙස එක් වූයේ භාරයට නව වටිනාකමක් හා වැදගත්කමක් එක් කරමිනි. ඇය ශ්‍රී ලංකා තරුණ ප්‍රජාව අතර සහයෝගිතාවය සහ සමගිය ගොඩනැංවීම පිළිබඳ විශ්වාස කරන්නෙකි

......... 8 වෙනි පිටුවට.

எகமுது ஒரே மக்கள்
UNITY MISSION TRUST
Ekamuthu Oray Makkal Unity Mission Trust

Unite . Heal . Integrate
Committed to fostering Unity, Reconciliation and Healing amongst teenagers and young adults across Sri Lanka

# යුනිටි කඳවුර 6 ...



1 වැනි පිටුවෙන්.........

600 කට ආසන්න පිරිසකට නවාතැන් ගැනීමට, ආහාර පාන සපයා දීම සඳහා අවශ්‍ය පහසුකම් සකස් කිරීමට සහ කිලිනොච්චි වැනි ප්‍රදේශයක මෙවැනි කඳවුරක් සංවිධානය කිරීම සඳහා භාරයේ සියලු දෙනාටම තමන්ගේ විවේක කාලය කැප කිරීමට සිදුවිය. යුනිටි මිෂන් භාරය ස්වේච්ඡා සංවිධානයක් වන අතර, දිවා රෑ නොබලා සේවය කරන කිසිවෙකුට කිසිඳු ගෙවීමක් නොකරන අතර, ඔවුන් මෙය සිදු කරන්නේ වටිනාකම මැනිය නොහැකි උදාර පරමාර්යක් උදෙසාය.



ඉන්පසු එළඹෙන්නේ සියළු දෙනාම එක්ව බස් රථ වල නැගී කිලිනොච්චි වෙත ගමන් කරන දිනයයි. ඉදිරි දින කිහිපය ඉතාමත් කාර්ය බහුල වේ. වෙහෙසකර වේ. එහෙත් සියළු දෙනා දිවා රෑ නොබලා වැඩ කරන්නේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම උදෙසාය. ඒ සියලු දේ අතර, වඩාත් සුන්දරම දෙය වන්නේ සිසුන් ටිකෙන් ටික අන් අය සමඟ බැඳීම්, මිතුදම් ඇති කර ගන්නා ආකාරය දැකීමයි. ලැජ්ජාශීලීව, තනිවම වාඩි වී එකිනෙකා සමඟ නුපුරුදු ලෙස සිනා සුන මොවුන් හතරවෙනි දිනය ආවසානයේ දී එකිනෙකා වැළඳගෙන අඩමින් එකිනෙකාට සමු දෙයි. සියළු බාධා බිඳ දැමීමට දින හතරක් වැනි කෙටි කාලයක් වුවද ප්‍රමාණවත් බව වටහා ගැනීමට මෙය ඔබගේ දෑසින්ම දැකිය යුතුය. සැබවින්ම මොවුන් අපගේ ජාතියේ බලාපොරොත්තුවයි.



ඔවුන් තුළින් ප්‍රදර්ශණය කෙරෙන දක්ෂතා ඉතාමත් විශිෂ්ටයි. නමුත් ඉතාමත් සුළු කාලයකදී පුහුණු වී ගායනා, නර්තන, කථන, රංගන ඉදිරිපත් කරන්නේ ඉතාමත් නිර්මාණශීලී ලෙසයි. හොඳම කණ්ඩායම් නායකයාට, කඳවුරුකරුවාට සම්මානයක් පිරිනමන අතර, ලකුණු ක්‍රියාපටිපාටියකට යටත්ව ජයග්‍රාහී කණ්ඩායමක්ද තෝරනු ලබයි.

නමුත් ඔබගේ හදවත වඩාත් ස්පර්ශ කරන්නේ කඳවුරේ අවසානයයි. සිසුන් ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳ සංවේදීව කථා කරන ආකාරයයි. තමන්ට හමවු නව මිතුරන් හට සමුදිය නොහැකිව කඳුළු සලන ආකාරයයි. මානව සබඳතා භාෂාව, ජාතිය, ආගම, සමාජ වටපිටාය යන සාධක වලින් ඔබ්බට ගිය අපූරු සබඳතාවක් බව එයින් ඔබට වැටහෙනු ඇත.

සියළුම දෙනා දැල්වූ ඉටිපන්දම් අතැතිව ආඩම්බරයෙන් අපගේ ජාතික ගීය ගායනා කර එකම හඬින් ‘ශ්‍රී ලංකා’ යන වචනය හඬනගා පවසන ආකාරය දකින ඕනෑම කෙනෙකුගේ දෑසට කඳුළු නැගෙනු ඇත.

අපගේ මාතෘ භූමියේ අනාගතය සඳහා වටිනා බලාපොරොත්තුවක් ඇති බව ඔබට වැටහේ. ඔබ එහි එක් කොටස්කරුවෙකි. කරන කුඩා දෙයකින් වුවත් සැබෑ වෙනසක් කළ හැකිය.

අපගේ හැකියාවන් යොදා ගනිමින් අප සියළු දෙනා මේ වෙනුවෙන් යමක් කළ යුතු වේ. අප ඇති කරන වෙනස අප ඉතිරි කර යන සැබෑ උරුමය වේ. වඩාත් වැදගත් වන්නේ ඔබ කොතරම් ප්‍රසිද්ධද, ඔබ කෙතරම් මුදල් උපයා ඇතිද, ඔබ කෙතරම් ජයග්‍රහණ ලබා ඇති ද යන්න නොවේ, නමුත් ඔබ කෙතරම් ජීවිත ගණනක් ස්පර්ශ කළේ ද වෙනස් කළේද යන්නයි.

ශාරන්‍යා සේකරම්



භාරකාර මණ්ඩලයේ සාමාජික රෙයාස් මිහුලර් සභාව අමතමින්




‘ඉටිපන්දම් උත්සවය’



කණ්ඩායම් නායකයින් UMT ජේෂ්ඨ සාමාජකයින් සමඟ

# Power ONE Hundred contd...

**POH**
**සඳහා විශේෂ ආරාධනාවන් පිළිගෙන පැමිනි**

**කථිකයින්**



*ජෙහාන් ජයසූරිය- හිටපු ශ්‍රී ලංකා 19 පහළ ක්‍රිකට් නායකයා සහ බොක්සිං ක්‍රීඩකයෙකු ලෙෂ ලැබූ අත්දැකීම් මත නායකත්වයේ සැබෑ මුහුනුවර පිළිබිඹු කළේය*



*රොසේන් කුරේ - කාර්යයක් කෙරෙහි තිබිය යුතු කපවීම*



*නිලක්ෂි ගුණතිලක*

## 1 වැනි පිටුවෙන්.........
## 'Power ONE Hundred'

......ප්‍රාදේශීය නායකයින් අතර සමීප සබඳතාවක් ගොඩ නැංවීමයි. මෙවැනි වැඩසටහන් කිරීමේ අරමුණ වන්නේ 'Power ONE Hundred' වැඩසටහන ළඟදී පාසල් අධ්‍යාපනය අවසන් කළ සිසුන් සහභාගි වීමත් ඔවුන් සමඟ කටයුතු කිරීම ඉතාමත් උද්යෝගිමත් අත්දැකීමක් වීමයි. යුනිටි මිෂන් භාරයේ කටයුතු සඳහා මූලික පදනමේ සිට වඩාත් හොඳින් සහභාගි වීමට ඇති ආශාව සහ කැපවීම මෙම වැඩසටහනට නව අවස්ථාවක් උදාකරන දොරටුවක් විය.

මෙම වැඩසටහන හරහා යුනිටි මිෂන් භාරයට විශාල ප්‍රාදේශීය නායකයින්ගේ ජාලයක් ගොඩනැංවීමට හැකි විය. එම නායකයින් තමන්ගේ දිස්ත්‍රික්කය තුළ සිටින සියළුම යුනිටි මිෂන් සාමාජිකයින් එකම ජාලයක් තුළට සම්බන්ධ කර ගන්නා අතර එය කොළඹ සිටින යුනිටි මිෂන් භාරයේ විධායකයන් වෙත සෘජුවම සම්බන්ධ වී තිබේ. මෙම වැඩසටහන හා සම්බන්ධ සසින් පසුකාලීනව 2014 වසරේ ස්ථාපිත කෙරුණු ප්‍රාදේශීය තරුණ කවුන්සිලයටත්, ඉන් අනතුරුව ජාතික නායකත්ව කවුන්සිලයටත් තෝරා ගනු ලැබේ.

මානසික සංවර්ධනයේ සිට සමාජ සාරධර්ම දක්වාද එතැන් සිට වටිනා දේශන වැඩමුළු තුළින්ද යුනිටි මිෂන් භාරය මෙම සිසුන් 100 දෙනා සන්නද්ධ කරන්නේ ශ්‍රී ලංකා මාතෘ භූමියේ අනාගත සාර්ථකත්වය උදෙසාය. ඒ එකමුතුකම, සහයෝගීතාවය සහ සමගිය ගොඩනංවා ගනිමින් අපගේ දිවයින වඩාත් සර්ථක තලයට ගෙන ආයුතු බව සැමවිටම මතකයේ තබා ගනිමිනි.

**ශාෂා පින්ටෝ ජයවර්ධන**





''මෙම වැඩසටහන මට ඉතාමත් ප්‍රයෝජනවත් වුණා. මාගේ ජීවිතය පිළිබඳ වැදගත් තීරණ ගැනීමේදී එනම් මාගේ අනාගත වෘත්තිය, මා ශ්‍රී ලංකාවට දිය යුතු දායකත්වය පිළිබඳව නව ආකාරයට සිතීමට මට හැකි වුණා.''
**කුවේණියා කුමාරසූරිය.**

''නායකයකු වීමේ සැබෑ අරුත සහ සැබෑ ලෝකය වෙතට පිය නැගීමේදී අප සන්නද්ධ විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව දේශකයින් පැහැදිලි කළ අතර එය අපට මග පෙන්වීමක් ලබා දුන්නේය. අපගේ තීරණ ගැනීමේදී සහයෝගයක් විය''





''යුනිටි මිෂන් භාරයේ දීර්ඝ කාලීන සාමාජිකයෙකු වන මට එකමුතුකම, මිත්‍රත්වය සහ නායකත්වය වැනි ජීවිතයේ වටිනා අංශ පිළිබඳ වඩාත් වැදගත් පාඩම් ඉගෙනගැනීමට හැකි විය. පළමුවැනි 'Power ONE Hundred' වැඩසටහනේ සාමාජිකයෙකු වීමට ලැබීම පිළිබඳ මට ඉතාමත් සතුටුයි. එය මගේ අත්දැකීම් පුළුල් කර ගැනීමට මෙන්ම පාසල් කාලයෙන් පසු මාගේ ජීවිතය සාර්ථක කර ගන්නා අයුරු මට ඉගැන්විය. **එරික් ඊවන්ස්.**



## 1 වැනි පිටුවෙන්
## බලාපොරොත්තුවේ අරුණැල්ල

මෙම වැඩසටහනේ මුල්ම අංගය ඉදිරිපත් කිරීම වෙනුවෙන්ම කොළඹට පැමිණ යාපනය මෙයිකන්දන් විද්‍යාලයේ නර්ථන කණ්ඩාමේ විශිෂ්ට ඉදිරිපත් කිරීම හා යුනිටි මිෂන් භාරයේ සියළුම පිරිමි සාමාජිකයින්ගේ සංගීත මඩුල්ල විසින් ගායනා කළ ඒ.ආර්.රහුමාන් ශ්‍රී ලංකාවේ සාමය උදෙසා විශේෂයෙන්ම සකස් කළ ''වෙල්ලයි පුක්කල්'' ගීතය මෙන්ම වයසින් අඩුම සාමාජිකාව වන මුලතිව් හි කුවේණියා කුමාරසූරිය විසින්ම තම මව්බිම වෙනුවෙන් සැකසූ ගීතය තුළින් ඉදිරිපත් කළ විශිෂ්ට හැකියාවන් ප්‍රේක්ෂක සිත් ඇඳ බැඳ ගන්නට විය. මින් අනතුරුව හිල්වුඩ් විද්‍යාලය විසින් අලංකාර නර්ථන අංගයක් ද තෝමස් විද්‍යාලයේ හේව්සි කණ්ඩායම විසින් බෙර වාදනයක් ද ඉදිරිපත් කළෝය. මෙම වැඩසටහනේ විශේෂිතම අංගය වූයේ 'එකමුතුකම සහ සහයෝගීතාවය සඳහා වන ජාතික සම්මාන' සමාරම්භක උළෙලේ ජයග්‍රාහකයින්ට ශිරන්ති

රාජපක්ෂ මැතිණිය විසින් සම්මාන ප්‍රධානය කිරීමයි. යුනිටි මිෂන් භාරය විසින් මෙම 'එකමුතුකම හා සහයෝගීතාවය' සඳහා වන සම්මාන උළෙල ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ අප රට තුළ එකමුතුකම සහ සහයෝගීතාව ඇති කිරීමට තරුණ පරපුරේ දායකත්වය ලබා ගැනීමට සහ ඒ සඳහා ඔවුන්ව දිරිමත් කිරීම තුළින් නව ශ්‍රී ලංකාවක් බිහි කිරීමටයි.

**භාග්‍යා වික්‍රමගේ**

# ඩේවිඩ්සන් කොලේජිය සමඟ පැවති  වැඩසටහන

පසුගිය නොවැම්බර් මස කොළඹ රමාදා හෝටලයේදී විශේෂ සහ නවතම වැඩසටහන් කිහිපයක් පවැත්වූයේ එම මස 4 සිට 6 යන තෙදින තුළ .ශ්‍රී ලංකාව තුළ එකමුතුකම, සහයෝගීතාවය සහ සමගය ගොඩනැංවීම . යන තේමාව මුල්කර ගත් සමුළුවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි එක්සත් ජනපදයේ ඩේවිඩ්සන් විද්‍යාලයේ 22 ක් වූ සිසුන් සහ ඔවුන්ගේ වැඩසටහන් අධ්‍යක්ෂක මහාචාර්ය හෙන්ස් මෙන්ක්හොස් මහතා යන පිරිසට අනුග්‍රහය දැක්වීමට සමගාමීවයි. ඩේවිඩ්සන් විද්‍යාලය 1837 වසරේ දී ආරම්භ කර ඇති අතර, එක්සත් ජනපදයේ උතුරු කැරොලිනාහි පිහිටා තිබේ. මෙය එක්සත් ජනපදයේ ඇති ප්‍රදාන ස්වාධීන කලා පාසල් 10 න් එකකි. සෑම වසරකටම 'Semester in India' වැඩසටහන සඳහා මොවුන් ඉන්දියාවට පැමිණෙන අතර මෙවර ප්‍රථම වතාවට ඔවුන්ගේ වැඩසටහන දින 10 කින් දීර්ඝ කරමින් ශ්‍රී ලංකාවට පැමිණීමට තීරණය කළෝය.

ඩෙවිඩ්සන් කොලේජිය සමඟ පැවති සමුළුව පැවති දින 03 ප්‍රවීණ දේශකයින් විසින් පැවැත් වූ වටිනා දේශන වලින් සමන්විත විය. එම දේශකයින් වූයේ කිලිනොච්චි ආරක්ෂක අංශ අණ දෙන නිලධාරී මේජර් ජෙනරාල් උදය පෙරේරා මහතා, වෛද්‍ය සෆරාස් මහතා, සිංගප්පූරුවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය හා ත්‍රස්තවාදය පිළිබඳ වූ අන්තර්ජාතික මධ්‍යස්ථානයේ ප්‍රධානී මහාචාර්ය රොහාන් ගුණරත්න මහතා, ශ්‍යාමලා කලා පාසලේ විදුහල්පතිනිය සහ යුනිටි මිෂන් භාරයේ මූලික භාරකාර ශ්‍යාමාලා පින්ටෝ ජයවර්ධන මහත්මිය, ජනාධිපති සමාජ සම්බන්ධතා අධ්‍යක්ෂක නන්දන විජේසිංහ මහතා, සහයෝගීතාවය සඳහා වූ ජනාධිපති උපදේශක සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය රජීව විජේසිංහ මහතා සහ යුනිටි මිෂන් භාරයේ මූලික භාරකාර සහ සම්බන්ධීකාරක බර්ටල් පින්ටෝ මහතාය . ඩේවිඩ්සන් විද්‍යාලයේ සිසුන්ට යුනිටි මිෂන් භාරයේ තරුණ තරුණයින් සමඟ එකිනෙකා හඳුනාගනිමින් අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දුන් අතර, එය ඔවුන්ගේ ප්‍රිතියට හේතු විය. ඔවුන් තමන්ගේ අමතක නොවන මතකයන් බෙදාගත් අතර, නව මිත්‍රත්වයන් ද ගොඩනගා ගත්තේය. යුනිටි මිෂන් භාරයේ තරුණ නායකයින්ට අන්තර්ජාතික සබඳතා ගොඩනගා ගැනීම සඳහා වන මූලික පියවරයක් ලෙස මෙම වැඩසටහන හැඳින්විය හැකියි. අනාගතයේ දී මෙම සම්බන්ධතා තුළින් නව අවස්ථා රාශියක බිහි වෙනු ඇත. යුනිටි මිෂන් භාරයේ සංගීත අධ්‍යක්ෂක වන රුක්ෂාන් පෙරේරාගේ මියුරු සංගීතයත් සමඟ වැඩසටහන නිම විය. 6 වන දින කොළඹ පැවති වැඩසටහන නිම වූ පසු මෙම සිසුන් ශ්‍රී ලංකාවේ පෞරාණික සහ සංස්කෘතිමය වටිනාකමින් යුත් ස්ථාන නැරඹීමට ගියෝය. යාපනය වෙත ගිය මොවුන්ව එහි සිටින යුනිටි මිෂන් තරුණ නායකයින් විසින් පිළිගනු ලැබූ අතර, ඔවුන් වෙනුවෙන් කෙටි වැඩමුළුවක් ද පැවැත්විය. තවද, යාපනයෙ ඇති විශේෂ ස්ථාන නැරඹීම සඳහා ද මොවුන්ව රැගෙන ගියෝය.

ශ්‍රී ලංකාව තුළ සුන්දර අත්දැකීම් රාශියක් ලබා ගත් මොවුන් නොවැම්බර් මස 13 වන දින මොවුන්ගේ සංචාරය නිමා කර තම රට බලා ගියෝය. එම සිසුන්ගෙන් බහුතරයකගේ පළමු ශ්‍රී ලංකා සංචාරය මෙය වු අතර ඔවුන් අප රටේ සංස්කෘතිය සහ මිනිසුන්ව බෙහෙවින් අගය කළෝය. ඩෙවිඩ්සන් විද්‍යාලයේ සිසුන්ට අනුග්‍රහය දක්වමින් ඔවුන්ට අපගේ ආදරණීය ශ්‍රී ලංකා ජාතිය පිළිබඳව අමතක නොවන අත්දැකීමක් ලබා දීමට හැකි වීම යුනිටි මිෂන් භාරයට ගෞරවයකි.

**අන්ෆාල් නිලාර් සහ හිර්නාස් නජිමුදීන්.**



ඩේවිඩ්සන් විංලයහි කථිකචාර්යවරයා ඇතුලු සහභාගී වූ සිසුන් UMT කණ්ඩායම සමඟ

# ප්‍රදේශීය ප්‍රවෘත්ති :  යාපනය

ඩේවිඩ්සන් විද්‍යාලයේ සිසුන්ගේ පැමිණීමත් සමඟ සිදුවූ සිදුවීම් මෙසේ වාර්තා කරන්නේ ඉතාමත් සතුටිනි. 2013 වසරේ නොවැම්බර් මස 11 වන දින 'ටිල්කො සිටි' හෝටලයේ දී අපි මෙම සිසුන් හා ඔවුන්ගේ ආචාර්යතුමන්ව පිළිගත්තෙමු. එහිදී ආචාර්ය හෙන්ස් සමඟ සැලසුම් සහ වැඩසටහන් පිළිබඳ සාකච්ඡා කෙරුණි. උදෑසනින්ම දවසේ කටයුතු ආරම්භ කිරීමට සියලු දෙනාම කැමැත්ත පල කළෝය. ඒ අනුව අපි පසු දින උදෑසන අපගේ වටිනා උරුමයක් වන යාපනය කොටුව නැරඹීමට ගියෙමු. ඉන්පසු යාපනයේ වර්ණවත් වූ වීදි දිගේ ඇවිදමින් යාපනයට සුවිශේෂී වූ බඩු බාහිරාදිය මිලදී ගන්නට විය. ටිල්කෝ හෝටලයේ රසවත් දිවා ආහාරයෙන් පසු සමුළුව ආරම්භ විය.

සාකච්ඡා කළ කරුණු බොහෝමයක් අධ්‍යාපනය සහ යුනිටි මිෂන් භාරයේ අනාගත ව්‍යාපෘති පිළිබඳව විය. මෙහිදී මූල්‍යම අපහසුතා ඇති සිසුන්ගේ අධ්‍යාපන කටයුතු නැංවීමට සහ වඩාත් හොඳ ඉගෙනීම වටපිටාවක් ඇති කිරීම සඳහා සිසුන් හා ගුරුවරුන් අතර සම්බන්ධතාවය වැඩි කිරීමෙ අදහස ඇතිව ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමේ හැකියාවන් ද සලකා බැලිනි. උසස් පෙළ අවසන් කළ සිසුන්ට ඇති ප්‍රධානම බාධකය වන්නේ තෘතික අධ්‍යාපනය කරා යොමුවීම වෙනුවෙන් ඔවුනට ඇති විවිධ අවස්ථා පිළිබඳ දැනුම අඩුකමයි. මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා උසස් අධ්‍යාපන වැඩමුළු සහ පුද්ගලික උපදේශන සැසි පිළිබඳ අවධානය යොමුවිය. තෝරාගත් සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන් පිළිබඳව ද මෙහිදි සාකච්ඡා කෙරිණි. යුනිටි මිෂන් භාරයේ ඉදිරි ව්‍යාපෘති සඳහා අවශ්‍ය අවධානය යොමුකර ගැනීම සඳහා සහ අවශ්‍ය මූල්‍ය සහයෝගයන් ලබාගැනීම සඳහා විදේශීය මාධ්‍ය තුළින් ලැබෙන සහයෝගයේ ඇති වැදගත්කම ද මෙහි දී සාකච්ඡාව ලක්විය.

සමුළුව අවසාන වු පසු සියළුදෙනා මනිපේයි හින්දු විද්‍යාලය, ජේදුරුතුඩුව මෙතෝදිස්ත විද්‍යාලය වෙත ගිය අතර යාපනයේ ජීවත් වන විශ්‍රාමික ඕස්ට්‍රේලියානු දේශයකු ද හමුවීමට ගියේය. ඉන් අනතුරුව යාපනය නගරය වටා ඇවිදිමින් විනෝද වූ අප නැවතත් හෝටලයට පැමිණි අතර එහිදී අපගේ නව මිතුරන්ට සමුදුන්නේ නුදුරු අනාගතයේදී ඔවුන්ව නැවතත් හමුවීමේ බලාපොරොත්තුව ඇතිවය.

**සජිසන්ගර් කරුණානිදි**



ඩේවිඩ්සන් විංලයහි කණ්ඩායම යාපනයේදී

# ජයග්‍රහණ සහ විශේෂ සිද්ධීන්

පහත යුනිටි මිෂන් සාමාජිකයන් විවිධ අංශ වලින් එනම් අධ්‍යාපන, කලා හෝ ක්‍රීඩා අංශ වලින් ජයග්‍රහණ ලබා ඇත. පසුගිය අ.පො.ස. උසස් පෙළ විභාගයේදී විශිෂ්ටතම ප්‍රථිඵල ලබාගත් අපගේ යුනිටි මිෂන් සාමාජිකයින් පිළිබඳ අප ආඩම්බර වන අතර ඔවුන්ට අපගේ සුභ පැතුම් එක් කරමු.



**ඈන් රෝෂේ**
මාරවිල



**ලියෝ ප්‍රෙස්ලි**
මන්නාරම



**ශෙහානි රජේන්ද්‍ර**
කොළඹ



**පමුදි මහේෂිකා**
මාරවිල



**සාශා පින්ටෝ ජයවර්ධන**
කොළඹ



**යශෝධා සෙල්වරාජ් (විශ්වමඩු)** දීර්ඝ කාලයක් පුරාවට යුනිටි මිෂන් භාරයේ සාමාජිකාවක ලෙස කටයුතු කරන මැය, උසස් අධ්‍යාපනය සඳහා මඩකලපුව විශ්ව විද්‍යාලයට තේරීපත් විය.



**සින්තුජා විජේරාජ්**, මැය තම තෘතික අධ්‍යාපනය සඳහා බදුල්ල ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය වෙත ඇතුලත් විය. මැයගේ ජයග්‍රහණය පිළිබඳ අප ආඩම්බර වෙමු.



**සාම්බාපි සිවාපි,** යාපනය උඩුවිල් බාලිකා විද්‍යාලයේ ශිෂ්‍යාවක් වන මැය 2013 වසරේ සහයෝගීතාවය පිළිබඳ ඇමරිකානු මධ-යස්ථාන තරඟාවලියේ ජයග්‍රාහිකාව විය .මැයගේ ජයග්‍රාහණය පිළිබඳ අපි අඩම්බර වෙමු.



**හිරුනි වීරසේකර,** මැය ශිෂ්‍යභට පුහුණුව අවසන් කර ඇති අතර ශ්‍රී ලංකා යුධ හම-_දාවේ දෙවැනි ලුතිනන් වරියක බවට පත්වී ඇත. එවැනි තනතුරක් ලබාගත් ප්‍රථම යුනිටි මිෂන් සාමාජිකාව මැයයි.



**ක්‍රිතිහා රාකේෂ්වරන්,** මහනුවර උසස් බාලිකා විද්‍යාලයේ ඉගෙනුම ලබන මැය 2013 වසරේ ඔක්තෝම්බර් මාසයේදී කිලිනොච්චිහි පැවැති යුනිටි කඳවුර 6 යේදී විශිෂ්ටතම යුනිටි කඳවුරුකරුවන් වෙනුවෙන් පිරිනැමුණු සම්මාන දෙකෙන් එක් සමමානයට හිමිකම් කීමට සමත් විය.



කෑගල්ල ශාන්ත ජෝශප් විද්‍යාලයේ **රන්සිකා ජයසිංහ** සහ කටුගස්තොට ශාන්ත අන්තෝනි විද්‍යාලයේ **රුෂ්දි හනාන්**, යුනිටි කඳවුර 6 දී හොඳම කණ්ඩායම් නායිකයින් ලෙස සම්මාන දිනාගත්තෝය.







තෙරේසා බාලිකා විද්‍යාලයේ **ශුෂ්මිතා රමේෂ්** සහ කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලයේ **සුන්දරලිංගම් සෙල්වකුමාර්** හට විශේෂ යුනිටි සම්මාන හිමිවූයේ කිලිනොච්චිහිද පැවැත්වූ යුනිටි කඳවුර 6 සාර්ථක කරගැනීම සඳහා ලබාදුන් දායකත්වය වෙනුවෙනි. මෙම සම්මාන යුනිටි මිෂන් භාරය වෙත ලබාදුන්නේ කිලිනොච්චි, ආරක්‍ෂක අංශ අණදෙන නිලධාරී, මේජර් ජෙනරාල් උදය පෙරේරා මහතා විසිනි.

පහත යුනිටි මිෂන් සාමාජිකයින් 2013 වසරේ නොවැම්බර් මස ඉන්දියාවේ රනචි හීදි පැවැත්වු සාර්ක් කනිෂ්ඨ ජාතික මළල ක්‍රීඩක ශූරතාවලියේදී විශේෂ දක්‍ෂතා දැක්වුවෝය.



**ශිවන්ති රත්නායක** - ජාතික කාන්තා කණ්ඩායමේ නායිකාව ලෙස නැවතත් පත් කෙරුණු මැය මීටර් 400 දීවිම තරගයේ රන් පදක්කමද මීටර් 4x400 රිලේ තරඟය නියෝජනය කරමින් තවත් රන් පදක්කමක්ද දිනා ගන්නට සමත්විය.



සුමන බාලිකා විද්‍යාලය නියෝජනය කරන **හර්ෂණී වත්සලාද** රන් පදක්කම දිනාගත් මීටර් 4x400 රිලේ කණ්ඩායම නියෝජනය කළාය.



රත්නපුර කුමර විද්‍යාලයේ **මලින් උදය කුමාර** මීටර් 110 කඩුළු මතින් පැනීම ඉසව්වෙන් රිදී පදක්කමද දුර පැනීම ඉසව්වෙන් ලෝකඩ පද-ක්කම ද දිනාගන්නට සමත්විය. මීට අමතරව යුනිටි කඳවුර 6 හිදී විශිෂ්ටතම කඳවුරුකරුවන් දෙදෙනා අතරින් එක් අයෙකුද විය.



රත්තපුර කුමර විද්‍යාලය නියෝජනය කරන **සමිත් ලක්මාල්** , මීටර් 4x400 රිලේ තරඟය නියෝජනය කරමින් රන් පදක්කමක්ද මීටර් 100 සහ 200 කෙටි දුර ධාවන ඉසව්වන්ගෙන් ලෝකඩ පදක්කම් දෙකක් ද දිනාගන්නට සමත්විය. 5

# කඳවුරුකරුවකුගේ හැඟීම්

මෙම කඳවුරට පැමිණීම මට මුලින්ම දැනුනේ පිහ-ිනුම් තටාකයක ගැඹුරුම ස්ථානයට වැටී, පිහිනීමට ඉගෙන ගැනීමට උත්සහ කරන නමුත් ගොඩ ඒමක් නොමැති ලෙසයි. පැතිකඩ ගණනාවකින් මෙය මගේ පළමු අත්දැකීමයි. මෙවැනි කඳවුරකට මා සහභාගි වූ ප්‍රථම අවස්ථාව මෙයයි, කිලිනොච්චි හෝ උතුරේ වෙනත් ප්‍රදේශකයට මා පැමිණි පළමු අවස්ථාව මෙයයි. එසේම යුනිටි මිෂන් භාරයේ කටයුත්තකට මා සහභාගී වූ ප්‍රථම අවස්ථාව ද මෙයයි. සිදුවීමට යන්නේ කුමක්ද යන්න පිළිබඳ මට කිසිඳු අදහසක් නොතිබුණි. එබැවින් මම මගේ මිතුරන් සමඟම රැඳෙන්නට විය. නමුත් ටික වේලාවකින් අපව කණ්ඩායම් වලට බෙදා වෙන් කෙරුණු අතර අප කණ්ඩායමේ නායකත්වය භාර ගැනීමට මට ආරාධානා කෙරිණි. මගේ කණ්ඩා-යමේ බොහෝ දෙනා මට වඩා වයසින් වැඩිවූ අතර එක්වරම එවැනි කණ්ඩායමකට නායකත්වය ලබාදෙන්නේ කෙසේද යන්න මට ගැටළුවක් විය. නමුත් අවසානයේ මට එය සාර්ථකව ඉටුකර ගත හැකිවුයේ අපගේ කණ්ඩායමේ පිරිමි කණ්ඩායම් නායකයාගෙන් ලද සහයෝගයත් සමඟයි.

දෙවැනි දිනය වඩාත් විනෝදාත්මක දිනයක් විය. ක්‍රීඩා කටයුතු වලදී විවිධ දක්‍ෂතා වලින් හෙබි මාගේ කණ්ඩායම සාමාජිකයින් අන් සියළු සාධක පසෙකලා තරඟකාරී මානසිකත්වයකින් කටයුතු කරන්නට විය. තෙවැනි දිනය වඩාත් අභියෝගාත්මක දිනයත් වූයේ එදින අපට භාෂා ත්‍රිත්වයම එකතු කරමින් නාට්‍යයක්, කණ්ඩායම් ගීතයත් සහ ලාංඡනයක් නිර්මාණය කිරීමට සිදු වු නිසාය. නමුත් අපගේ කණ්ඩායම් අධීක්‍ෂකගේ සහයෝගයත් සමඟ එයද සාර්ථකව ඉටුකරගැනීමට හැකිවිය. සිව්වන දිනය වඩාත් දුක්මුසු දිනයක් වූයේ කඳවුර අවසානයේ අප සියළු දෙනාට සමුදී අපසු යා යුතු නිසාය. කෙසේ වෙතත් මා වඩාත් සතුටට පත් වූයේ මාගේ කණ්ඩායමේ එක් සාමාජිකයකු මා වෙත පැමිණ මා හොඳ කණ්ඩායම් නායිකාවක් බව පැවසු විටයි. එකිනෙකාට සමුදීම අසිරු වුවත් අප සියළු දෙනා සතුටු වන්නේ අප තුල ඇති ශක්තීන් හඳුනා ගැනීමට අපට ලැබුණු හැකියාව නිසයි. අවසානයේ මෙය මට කිසිදා අමතක නොවන අත්දැකීමක් විය.



**කවීෂා ෆර්නෑන්ඩු,**
**කාන්තා විද්‍යාලය,**
**කොළඹ.**

# නව ඇරඹුම

ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ නව පිටුවක් ලිවීමට දැන් කාලය එළඹ ඇත. මෙය නව සහ වඩාත් හොඳ ඇරඹුමකට අප ලද අවස්ථාවකි. මෙම අවසථාවෙන් ප්‍රයෝජන ගැනීම අපගේ යුතුකමයි. ශ්‍රී ලංකා ජාතියේ අනාගතය පවතින්නේ අද දින තරුණ නායකයින් වන අපගේ දෑත් මතයි. මා මෙසේ ඔබට පැවසීමට උත්සාහ ගන්නේ 2013 වසරේ ඔක්තෝම්බර් මස කිලිනොචචිහිදී පැවති යුනිටි කඳවුර 6 දී මා ලද අපූරු අත්දැකීම් පිළිබඳවයි.

මෙය මාගේ ප්‍රථම යුනිටි කඳවුරු අත්දැකීමයි. කුමක් බලාපොරොත්තු වන්නට දැයි නොදැන මම බියෙන් සහ කලබලයෙන් පසුවීමි. දින සතරක් පුරාවට පැවති කඳවුරේ පළමු දිනයේදී මා මගේ කණ්ඩායමේ නායකයා ලෙස පත් කෙරිණි. බියෙන් සහ කලබලයෙන් සිටි මම ලද මෙම නව වගකීමක් සමඟ කෙදිනකවත් හමුනොවු මිතුරු මිතුරියන් සමඟ වැඩ කටයුතු කරගෙන යමින් කණ්ඩායමට නායකත්වය ලබාදීමට දිරිගැන්වීමක් ලැබුණි. මෙම කඳවුරේ තේමාව වූයේ "ඔබගේ සිහින බලගැන්වීමයි". යුනිටි මිෂන් කණ්ඩායම සැබැවින්ම අපගේ සිහින බලගන්වුවේය. මේ සඳහා ඔවුන් යොදාගත් උදාහරණ, පැහැදලි කිරීම පුදුම සහගත විය. රාජලින් පිළිබඳ කථා පුවත ඉතාමත් සිත් ඇදබැඳ ගන්නා සුළුය. එවැනි ධෛර්යයකින්, ශක්තියකින් සහ පැහැදිලි දැක්මකින් යුත් ජීවියකුගේ ජිවිත පිළිබඳ කථා අපගේ සිහින හඹා යෑම උදෙසා අපට මහත් දිරිගැන්වීමකි.

කිසිදු දමිළ වචනයක් කථා කර නොමැති අප, දමිළ අකුරක් නොදන්නා අපට දින 4 ක් තුළ දී උතුරු දකුණු යා කරමින් මිතුරුදම් ගොඩ නගා ගත හැකිවිය. එපමණක් නොව සෙනෙහස සහ එකිනෙකා අතර අවබෝධය ඇතිකර ගැනීමට ද හැකි විය. මේ සඳහා අපට නිවැරදි මඟ පෙන්වීම ලබා දුන්නේ යුනිටි කඳවුර බව මා පවසන්නේ ඉතාමත් ආඩම්බරයෙනි.

කඳවුර තුළ පැවති සියළුම ක්‍රියාකාරකම් හරහා අපගේ සියළු බාධක, වෙනස්කම් පසෙකලා එකට එක්ව අවබෝධයෙන් කටයුතු කිරීමට අපට අවස්ථාව සැලසුණි. ක්‍රීඩා කටයුතු වලදී නාට්‍ය,කථික තරඟ,දේශන,කලා සහ අත්කම් එමෙන් ම සංගීත වැඩසටහන් වලදී පවා යුනිටි මිෂන් කණ්ඩායම උත්සහ කළේ අපට එකිනෙකතා අතර ඇති වෙනස්කම් අමතක කරමින් එකිනෙකා අතර ඇති සමානාත්මතාවයන් අවබෝධ කර දීමටයි.

කඳවුර අවසාන දිනයේදී 'ඉටිපන්දම් උත්සවය' පැවැත්වුණි. මට එහිදී වචනයෙන් විස්තර කල නොහැකි තරමේ අමුතුම හැඟීමක් දැනෙන්නට විය. කූවුර තුළ දී මට වැඩිම බලපෑමක් ඇති කළේ මෙම අංගයයි. දින සතරක් පුරාවට අප සැවොම එක පවුලක සහෝදර සහෝදරියන් ලෙස, මිතුරු මිතුරියන් ලෙස සියළු බාධක පසෙකලා කටයුතු කළෝය. මෙය මගේ ජීවිතය වෙනස් කළ අත්දැකිමක් විය. යුනිටි මිෂන් භාරයේ මෙම අපූර්ව වූ කටයුතු දිගින් දිගටම කරගෙන යාමට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරන අතර අප රටේ අනාගත නායකයිනිගේ ජීවිත ධනාත්මක ලෙස, අපූර්ව ලෙස වෙනස් කිරීමේ පුරෝගාමියා ලෙස ඉදිරියටත් කටයුතු කිරිමට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**අශාන් සමීර සහ ඩිෂාන් චමික**
**මාතර**

# යුනිටි කඳවුර

යුනිටි කඳවුරට සහභාගිවීම පිළිබඳව ආඩම්බර වන මම මෙසේ ඒ පිළිබඳ වාර්තා තබන්නේ ඉතාමත් සතුටිනි.මා ප්‍රථම වතාවට යුනිටි කඳවුරකට සහභාගි වූයේ 2010 දෙසැම්බර් වලදී ය. උඩුවිල් බාලිකා විද්‍යාලයේ සිසුන් 30 දෙනෙකු යුනිටි මිෂන් භාරය විසින් කොළඹ දී පැවැත්වූ දින 3 ක යුනිටි කඳවුරක් සඳහා එහිදී සහභාගී විය.මෙය අප සියළු දෙනාටම සහ අප සමග පැමිණි ගුරුවරුන් සියළු දෙනාටම නැවුම් අත්දැකීමක් විය. කොළඹට පැමිණි අපට යුනිටි විෂන් කණ්ඩා-යමේ උණුසුම් පිළිගැනිම් ලැබුණු පුතර ඔවුන් අපව බිෂෝප් විද්‍යාලය වෙත රැගෙන ගියෝය. උදෑසන ආහාරයෙන් පසුව අපව වෙස්ලි විද්‍යාලය වෙත රැගෙන ගිය අතර එහිදී වැඩටහන පිළිබඳව අපව දැනුවත් කෙරිණි. ඉන් පසුව ශ්‍රී ලංකාවේ නන් දෙසින් පැමිණි අයට අපව හඳුන්වා දුන්නේය.

පළමුවන දිනයේදී කඳවුරුකරුවන් සියළුදෙනා කොළඹ නගරය නැරඹීමට රැගෙන ගියෝය. දෙවන දිනයේදී අපව කණ්ඩායම් වලට බෙදුණු අතර සෑම කණ්ඩායමකටම යම් කිසි කාර්යයක් පැවරුණි. අපගේ කණ්ඩායමට පැවරුණු කාර්යය වනනේ ආභරණ සැකසීමයි. යුනිටි මිෂන් කණ්ඩායම විසින් අපට ලබා දුන් පබළු යොදාගෙන අපි අලංකාර ආභරණ නිර්මාණය කළෙමු. එදින සවස් භාගයේදී අපව කොළඹ කාන්තා විද්‍යාලය වෙත රැගෙන ගිය අතර එහිදී සෑම පාසලකටම යම් ඉදිරිපත් කිරීමක් කරන්නට සිදු විය. එහිදි අප මයිකල් ජැක්සන් විසින් ගායනා කල ,ඍක එයැ උදරකා , ගීතය ගායනා කළ අතර එය සියළු දෙනාගේ ප්‍රසාදයට ලක්විය. සහභාගී වූ අන් අය කළ ඉදිරිපත් කිරීම් නරඹමින් අප එම සවස් භාගය විනෝදයෙන් ගත කළෙමු.

අවසාන දිනයේ දී අපව සත්තු වත්ත නැරඹීමට සහ බද උදරකා, නැරඹීමට රැගෙන ගිය අතර එහිදී අප ඉතාමත් විනෝද වීමු. ඉන් අනතුරුව අපගේ මිතුරු මිතුරියන්ට දුකෙන් හෝ සමුදීමට අපට සිදු වූවත් අප ලද අත්දැකීම් ඉතාමත් සුන්දර අත්දැකීම් ලෙස සැමදා අපගේ මතකයේ රැදෙන්නට විය. නැවතත් 2012 දී යුනිටි කඳවුරක් සඳහා මහනුවර වෙත යාමට අපට අවස්ථාව සැලසුණි. අප ඔක්තෝම්බර් මස 26 වැනි වැනි මහනුවර බලා පිටත් වූයේ පාසල් කිහිපයක සිසුන් ද සමගයි. එය ඉතාමත් විනෝදයෙන් පිරි චාරිකාවක් විය. අපි සවස 6 පමණ වන විට මහනුවර ත්‍රිත්ව විද්‍යාලයට පැමිණිය අතර ඒ වන විට වැඩසටහන් ආරම්භ වී තිබුණි. ටික වේලාවකින් පසු අපව කණ්ඩායම් වලට බෙදා වෙන් කෙරුණේ සෑම කණ්ඩායමකට ම විවිධ ආගම් හා සංස්කෘතික වට පිටා වලින් පැමිණි සිසුන් ඇතුළත් වන පරිදිය. මා කණ්ඩායම් අංක 14රේ කණ්ඩායම් නායිකාව ලෙස පත් කෙරුණ අතර මාගේ කණ්ඩායමේ මිතුරියන් කිසිවෙකු නොමැති වීම පිළිබඳ මම දුක් වීමි. මම කණ්ඩායම් සාමාජිකයින්ට මා හඳුන්වා දුන් අතර ඉන් පසුව සංවිධායක මඩුල්ලේ උපදෙස් වලට අපි ඇහුම්කන් දීමු.

එදින කටයුතු අවසාන වූ පසු ගැහැණු ළමයන්ව මොව්බ්‍රි විද්‍යාලය වෙත රැගෙන ගියෝය. පසුදා උදෑසන අප නැවතත් ත්‍රිත්ව විද්‍යාලය වෙත පැමිණියෙමු. අපගේ කණ්ඩායම් තුළ රැඳෙමින්,ආරාධිත දේශකයින්ගේ දේශනවලට සවන් දුන් අපට දිවා ආහාරයෙන් පසු විනෙ-ා්දයෙන් පිරි ක්‍රීඩා වැඩසටහනකට සහභාගී වීමට හැකි විය. එදින සවස් භාගයේ සංගීතයෙන් පිරි විනෝදාත්මක හෝරා කිහිපයක් විය.

තෙවැනි දිනයේදී සියළුම තරඟ පැවැත්වුණි.මම ඉංග්‍රීසි භාෂා කථන තරඟයට සහභාගී වූ අතර ඉන් තෙවැනි ස්ථානය දිනා ගැනීමට හැකිවිය. දැන්වීම් නිර්මාණය සහ ලාංඡන නිර්මාණය කිරිමේ තරඟ මෙන් ම තවත් තරඟ මෙහිදී පැවැත් විය. මෙහදි සෑම කණ්ඩායමකටම ''තනි පුද්ගලයකුගේ බලය'' යන තේමාවේ යටතේ යම් ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට සිදු වු අතර ඒ වෙනුවෙන් අප මයිකල් ජැක්සන්ගේ ,ඍක එයැ උදරකා , ගීතය ගායනා කළ අප එම තරඟයේ අවසන් වටයට තේරීපත් විය.තරඟ ප්‍රතිඵල නිකුත් වූ අතර අපගේ කණ්ඩායම සියළුම තරඟ වල ලකුණු අනුව හතරවැනි ස්ථානය ලබා ගෙන තිබුණි. ඒ වෙනුවෙන් අපට ත්‍යාග සහ සහතිකපත් හිමිවිය.

අවසාන දිනයේදී යුනිටි මිෂන් කණ්ඩායම, සහභාගී වූ සියළු දෙනාට ස්තූතිය පළ කළේය. ඉන්පසු අපි අපගේ නව මිතුරන්ට සමු දි නැවත පැමිණියෙමු. ශ්‍රී ලංකාවේ නන් දෙසින් පැමිණි සිසුන් හමුවීමටත්, ඔවුන්ගේ විවිධ දක්ෂතා හා හැකියාවන් දැකීමට හැකිවීමත්, ඒ සියළු දෑ මාගේ මිතුරියන් හා ගුරුවරුන් සමග බෙදා ගැනිමට හැකිවීමත් ඉතාමත් විශේෂ අත්දැකිමක් විය. සැබවින්ම යුනිටි කඳවුරේදි අප ලද අත්දැකිම් ඉතාමත් සුන්දර මෙන්ම අමතක නොවන අත්දැකිම් විය.

**සාම්බාජි සිවාජි,**
**උඩුවිල් බාලිකා විද්‍යාලය,**
**යාපනය.**



# රැක්ෂාන් පෙරේරා සමඟ සංගීත ප්‍රසාංගය

මෙම වැඩසටහන 2014 වසරේ ජනවාරි 19 වන දින බිෂෝප් විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වූයේ නොනවත්වා සිව්වන වරටයි. මෙයින් රැස්කරගත් සියළු මුදල් 2014 වසරේ යුනිටි මිෂන් භාරයේ කටයුතු සඳහා යොදා ගැනිමට නියමිතයි.









# එන්න, යුනිටි මිෂන් භාරය සමඟ හවුල් වෙන්න!!



*6 වැනි එකමුතු කඳවුර "කිලිනොච්චිය*

*එක් දැල්ලක ආලෝකය දහසක් දැල් දැල්වූවාය*

ඔබ යුනිටි මිෂන් භාරය පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීමට කැමතිද? යුනිටි මිෂන් භාරයේ ඉදිරි වැඩ කටයුතු සඳහා සහයෝගය දැක්වීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීමට ඔබත් කැමතිද?

වැඩි විස්තර සඳහා අපව සම්බන්ධ කරන්න.

ඉතාමත් කාරුණික පුද්ගලයින් සහ දුරදිග සිතා බලා කටයුතු කරන ව්‍යාපාරික ආයතන වලින් අප වෙත ලැබෙන සහයෝගය සහ දිරිගැන්වීම් යුනිටි මිෂන් භාරයේ අපි බෙහෙවින් අගය කරමු. ශ්‍රී

ලංකාවී අනාගතය ශක්තිමත් කිරීම සඳහා යුනිටි මිෂන් භාරය සමඟ හවුල් වීමට ඔබත් කැමති ද? එසේනම් පහත සඳහන් විකල්ප සලකා බලා ඔබගේ කැමැත්ත අප වෙත දන්වන ලෙස අප ඔබට ආරාධනා කරමු.

⇒ එක් දින 'Zoom - In ' වැඩසටහනකට අනුග්‍රහය දැක්වීමට - රු.125,000/=

⇒ යුනිටි කඳවුර 7 සඳහා සහභාගී වන එක් (හෝ කිහිපදෙනෙක්) සිසුවකුට අනුග්‍රහය දැක්වීම - එක් අයෙකුට රු. 5000/= බැගින්

⇒ යුනිටි කඳවුර 7 සඳහා සහභාගී වීමට නියමිත සිසුන් 25 දෙනෙකුගෙන් සමන්විත එක් වැඩ කණ්ඩායමක් (මෙවැනි කණ්ඩායම් 20 ක් ඇත) සඳහා අනුග්‍රහය දැක්වීම - රු. 125,000/=

⇒ මාස තුනක කාලයක් සඳහා වන්නි ප්‍රදේශයේ එක් ස්ථානයක පැවැත්වෙන ඉංග්‍රීසි භාෂා පන්ති සඳහා අනුග්‍රහය දැක්වීම - රු. 36,000/= - වන්නි ප්‍රදේශයේ සිටින එක් සිසුවකුගේ අධ්‍යාපන කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම - මසකට රු. 4500 බැගින්

මුදල්/ චෙක්පත් බැර කිරීම : Ekamuthu Oray Makkal Unity Mission Trust / බැංකුව : මහජන බැංකුව/ ගිණුම් අංකය ***014100180004373 |***

**දැන් ඔබට අන්තර්ජාලය හරහාද අපට උපකාර කළ හැක**
**අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න ⟶ Payment Gateway යනුවෙන් ඇති බොත්තම වෙත යොමු වන්න**
**එතැන්සිට ලබා දී ඇති උපදෙස් පිළිපැද අප වෙත ඔබගේ උපරිම සහයෝගය දක්වන්න**

# ඉදිරි කටයුතු

⇒ UMT තරුණ නායකයින් සහ උතුරු පළාත් අධ්‍යාපනික කටයුතු අමාත්‍යාංෂයේ සම්භන්ධීකරණ නිලධරීන් සමඟ වැඩසටහන 2014 ජනවාරි මස සම්පූර්ණ කරන ලදි.

⇒ යුනිටි මිෂන් භාරය පෙබරවාරි මස 14 වැනි දින මහනුවරදි '' ජාතික තරුණ නායකත්ව කවුන්සිලය'' පිහිටවූයේය.

⇒ එදිනම උතුරෙන් සහ දකුණෙන් පැමිනි UMT සාමාජිකයින් 135 දෙණෙකුගේ සහභාගීත්වයෙන් ZZoom - In' 5 වැඩසටහන ද පැවැත්වීනි. මෙම වැඩස-ටහන අප මහනුවර පලාත් භාර කමිටුව විසින් සංවිධානය කරන ලදි

⇒ 'Zoom - In' 6 සහ 7 '' වැඩසටහන් මැයි 2 සිට 4 යන තෙදින තුළ පැවැත්වීමට නියමිතයි. මෙම වැඩසටහන් පිළිවෙලින් මන්නාරම සහ වව්නියාව හිදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

**1 වැනි පිටුවෙන්**

**භාරකාර මණ්ඩලයේ නව සාමාජික**

.......අප රටෙහි සිටින තරුණ නායකයින්ට එකිනෙකා සමඟ සම්බන්ධ විමේ ඇති වැදගත්කම පිළිබඳ අවබෝධයක් ඇති කිරීම සහ ඒ සඳහා සිසුන් දිරිගැන්වීම පිළිබඳ වික්‍රමසිංහ මහත්මිය කථා කරන්නේ ඉතා උද්යෝගයෙනි. ඇය අප සමඟ එක්වීම පිලිබඳව අප බෙහෙවින් සතුටු වන අතර යුනිටි මිෂන් භාරයේ කටයුතු වලට ඇය නව වටිනාකමක් එක් කරන බව අපට විශ්වාසයි!

# අප හා සම්බන්ධ වීමට

යුනිටි මිෂන් භාරයේ කාර්යාලය :
නො. 3, සිරිපා මාවත, තිඹිරිගස්යාය, කොළඹ 05.

දුරකථන : 0094112582544

විද්‍යුත් තැපෑල ( bertal@unitymission.lk
(0773660103 අමතන්න)

http://www.facebook.com/Unity-Mission-Trust-UMT/

@UnityMission

වෙබ් අඩවිය : www.unitymission.lk

භාරකාර මණ්ඩලයේ සභාපති :- මේජර් ජෙනරාල් (හිටපු) ලොහාන් ගුණවර්ධන මහතා

මූලික භාරකාර/සම්බන්ධීකරණ :- බර්ටල් පින්ටෝ ජයවර්ධන මහතා.

# ඔබගේ ප්‍රතිචාරය අප බලාපොරොත්තු වෙමු!

ඔබගේ ප්‍රතිචාර පහත සඳහන් කවර හෝ සාමාජිකයකු වෙත යොමු කරන්න.

**සංස්කාරක**: අශ්නි පෙරේරා - ashniperera@gmail.com

**සංස්කරණ කණ්ඩායම** : අන්ෆාල් නිලාර්, භාග්‍යා වික්‍රමගේ, හිර්නාස් නජිමුඩීන්, සාශා පින්ටෝ ජයවර්ධන

**පරිවර්තන** : ගුණරාජා ප්‍රන්තාබන්, කසුනි හපුආරච්චි, ලියෝ ප්‍රෙස්ලි සහ සින්තුලන් පද්මනාදන්

**ඡායාරූපකරණය**: චරිත රූපසිංහ, කෝසල වික්‍රමනායක, සජීසන්ගර් කරුණානිදි

Trustees: Maj.Gen.(Rtd).Lohan Goonewardena, RSP, VSV, USP, ndc, IG (Chairman), Anushya Coomaraswamy, Kushan D'Alwis-PC, Dian Gomez, Prof. Rohan Gunaratne, Sudarshani Hettige, Dr. Wimal Karandagoda, N. Vasantha Kumar, Reyaz Mihular, Shyamala Pinto-Jayawardena (Co-Founder Trustee), Chandra Schaffter, Ramola Sivasundaram, Dushyanthi Thusheetharan, Sanath Weeratunga, Nirmali Wickremasinghe
Founder / Co-ordinating Trustee: Bertal Pinto-Jayawardena